# මිලින්ද මොරගොඩට ජාත්‍යන්තර උපදේශක තනතුරක්



තිරසාර සමුද්‍රිය ආර්ථිකයක් සඳහා වූ ඉහළ පෙළේ අන්තර් ජාතික වැඩසටහනේ උපදේශක මණ්ඩල සාමාජිකයෙක් වශයෙන් සේවය කිරීම සඳහා මිලින්ද මොරගොඩ මහතා ඇරයුම් ලැබ සිටී. මෙම උපදේශක මණ්ඩලය අන්තර් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රධාන පෙළේ සමාගම් වල සමුද්‍ර ආර්ථිකයක් ඇති කිරීමේලා පියවර ගනිමින් සිටින ප්‍රධානීන්ගෙන් සමන්විතය.

ඕස්ට්‍රේලියාව, කැනඩාව, චිලී, ෆීජී, ඝානා, ඉන්දුනීසියාව, ජැමෙයිකා, ජපානය, කෙන්යා, මෙක්සිකෝ, නැමීබියාව, නෝර්වේ, පලාවු සහ පෘතුගාලය යන රටවල ජනාධිපති සහ අගමැතිවරු මෙම උපදේශක මණ්ඩලය නියෝජනය කරති. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාගරය සම්බන්ධ විශේෂ නියෝජිතයා ද සහාය සාමාජිකයකු සේ ක්‍රියාකරයි. තිරසාර සමුද්‍ර ආර්ථියක් ගොඩනැගීමේ වැඩසටහනට ලෝකයේ සියලුම රටවල නායකයෝ නිල වශයෙන් සම්බන්ධ කරගෙන ඇති අතර දේශපාලන අනුග්‍රහය හා උපරිම ශක්තියකින් ක්‍රියාකිරීම එහි අරමුණ වී තිබේ.

2005-2008 කාලයේ දී මිලින්ද මොරගොඩ මහතා, දරිද්‍රතාවය තුරන් කිරීමට නෛතික වශයෙන් බලවත් කිරීම සඳහා වූ ඉහළ පෙලේ කොමිසමේ සේවය කළ අතර හිටපු ඇමරිකානු රාජ්‍ය ලේකම් මැඩිලින් ඕල්බ්‍රයිට් සහ අද්විතීය ආර්ථික විශේෂඥයකු වූ හෙමර්නාඩෝ ද සොටෝ එහි සම සභාපතිවරු වශයෙන් ක්‍රියා කළහ. එම කොමිසම ද රාජ්‍ය නායකයන්, ආර්ථික විශේෂඥයන් හා ඉහළ පෙලේ ලෝක නායකයන්ගෙන් සමන්විත වූ අතර එහි වාර්තාව ලෝකයේ සෑම රටකටම නිකුත් කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය පියවර ගත්තේය.

■ ගාමිණී සරත් ගොඩකන්ද